විශ්‍රාම වැටුප් චක්‍රලේඛ : 3/2015(සංශෝධන VI)

මගේ අංක : විවැ/චක්‍රලේඛ 2021
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත
කොළඹ 10
2021.09.10

ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය,

පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ,

පෞද්ගලික පාසැල් අධ්‍යාපන අධ්‍යක්ෂ,

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

**විශ්‍රාම ගනු ලබන දිනටම විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබාදීම.**

**(විශ්‍රාම වැටුප් අයදුම්පත් මාර්ගගතව (Online) යොමු කිරීම)**

2016.09.09 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 3/2015(III) අනුව පාසැල් ගුරු විශ්‍රාම වැටුප් පනත යටතේ සම්පාදිත නියෝගයන්හි 6 වන වගන්තිය යටතේ විශ්‍රාම වැටුප් හිමිකම ලබන පෞද්ගලික පාසැල් හා පිරිවෙන් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් හිමිගැන්වීම මධ්‍යගත ක්‍රමයට ක්‍රියාත්මක කරන ලදී. 2009.04.24 දිනැති හා අංක 1598/20 දරන අති විශෙෂ ගැසට් නිවේදනය අනුව 1953 අංක 44 දරන පනත අනුව විශ්‍රාම වැටුප් හිමිකම ලබන ගුරුවරුන්ට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන බලපැවැත්වෙන බැවින් එම විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් හිමිගැන්වීම තවදුරටත් කඩිනම් කිරීම සඳහා එම නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් අයදුම්පත් 2021.10.01 දින සිට විමධ්‍යගත ක්‍රමයට කිරීමට තීරණය කර ඇත.

02. මෙලෙස විමධ්‍යගත ක්‍රමයට අයදුම්පත් යොමු කළ යුත්තේ 2014.10.01 දිනට පසු විශ්‍රාම යන පෞද්ගලික පාසැල් හා පිරිවෙන් ගුරුවරුන් සඳහා පමණි.අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 3/2015(II) අනුව ඉදිරිපත් කළ යුතු ලේඛන වලට අමතරව පහත ලේඛනද ඉදිරිපත් කළ යුතුය.

I. අනුමත යෝජනා පත්‍ර (පිරිවෙන් කිහිපයක සේවය කර ඇත්නම් ස්ථාන මාරුවීම් ලිපි, පෞද්ගලික පාසැල් කිහිපයක සේවය කර ඇත්නම් එම පාසල් වලට අදාළ යෝජනා පත්‍ර) - ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ලිපිය වෙනුවට මෙය සලකා බලනු ලබයි.

II. අධ්‍යාපන සී 141 ආයක මුදල් පත්‍රය.

- සේවා කාලය සඳහා දායක මුදල් පහත පරිදි අයකර තිබිය යුතුය.

| දායක මුදල් | W & OP | TP |
|---|---|---|
| 2003.01.01 ට පෙර | 2% | 2% |
| 2003.01.01 – 2012.02.03 | 6% | 2% |
| 2012.02.03 ට පසු | 6% | 6% |

III. විශ්‍රාමිකයා පැවිදි අයෙක් නම් පැවිදි සහතිකය (මෙය අදාල වන්නේ භික්ෂූන් වහන්සේලාට පමණි)

IV. සේවා කාලයේදී විශ්‍රාමිකයා පැවිදි වී සිට උපැවිදි වී ඇත්නම් උපැවිදි සහතිකය (මෙය අදාළ වන්නේ උපැවිදි වූ අයට පමණි)

03. අයදුම්පත් යොමු කිරීමේදි සෑම විටම නිවැරදිව හා පැහැදිලිව තොරතුරු ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 3/2015 (V) උපදෙස් පිලිපැදිය යුතුය.

04. 2014.10.01 දිනට පෙර විශ්‍රාම ගැන්වූ නිලධාරීන්ගේ ප්‍රමාද වූ අයදුම්පත්‍ර හා විශ්‍රාම වැටුප් හිමිකම පිලිබඳ ගැටලුකාරී තත්ත්වයන් පවතින අයදුම්පත් තවදුරටත් මධ්‍යගත ක්‍රමය හරහාම ඉදිරිපත් කළ යුතුය.

ඒ.ජගත් ඩී.ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

| | |
|---|---|
| 01. ජනාධිපති ලේකම් | - කරු.දැ.ගැ.ස |
| 02. ලේකම්, මුදල් අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස |
| 03. ලේකම්, රාජ්‍ය සේවා,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස |
| 04. ලේකම්, දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස |
| 05. විගණකාධිපති | - කරු.දැ.ගැ.ස |
| 06. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් | - කරු.දැ.ගැ.ස |
| 07. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් | - කරු.දැ.ගැ.ස |